*සැ. යු.*– 2007.09.28 වැනි දින පළ කරන ලද අංක 1,517 දරන *ගැසට් පත්‍රයේ* II සහ IV(අ) කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,518 — 2007 ඔක්තෝබර් 05 වැනි සිකුරාදා — 2007.10.05**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු … … … … | — | විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … | 1099 |

*සැ. යු.*–(i) විශේෂ භාණ්ඩ බදු පනත් කෙටුම්පත 2007, අගෝස්තු මස 10 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත 2007, අගෝස්තු මස 10 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු පනත් කෙටුම්පත, 2007 අගෝස්තු මස 10 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 ඔක්තෝබර් මස 12 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 සැප්තැම්බර් මස 28 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධි විධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම් කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ටද, ඔහුගේ සහාකාරයින්ටද, අනිකුත් විභාගාපේක්ෂකයින්ටද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාගශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම්ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු වනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හෝ ජ්‍යාමිතික උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම්ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලිවීමටද යත්න දැරීම තහනම්ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම් කරුවෙකුට උදව්දීමෙන්ද, වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබාගැනීමෙන්ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියන විට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල්ය. විභාගාපේක්ෂකයින් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය :

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්ට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රේදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිවද පිරිසිදුවද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහාය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්නද, තෝරා ගත යුතු අන් ප්‍රශ්නද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන්වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සළකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

### ආයුර්වේද සිසු හෙද පුහුණුවට බඳවා ගැනීම - 2007

ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ සිසු හෙද පුහුණුව සඳහා බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *අධ්‍යාපන සුදුසුකම් :*

(අ) පැරණි විෂය නිර්දේශය යටතේ අ.පො.ස. (උ.පෙළ) විභාගයට එකවර පෙනී සිට විද්‍යා විෂයය ධාරාවන්ගෙන් විෂයයන් 04ම සමත්ව තිබීම හෝ නව විෂය නිර්දේශය යටතේ අ.පො.ස. (උ.පෙළ) විභාගය එකවර පෙනී සිට විද්‍යා විෂයය ධාරාවන්ගෙන් විෂයයන් 03 ම සමත්ව තිබීම : සහ

(ආ) අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ, ගණිතය හා විද්‍යාව යන විෂයයන්ට සම්මාන 04ක් සහිතව විෂයයන් 06කින් සමත්වී තිබීම.

අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉහත විභාග දෙකෙහි සහතිකවල සහතික කළ ඡායා පිටපත් අමුණා එවිය යුතුය.

2. *අනෙකුත් සුදුසුකම් :*

(අ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය ;

(ආ) 2007.11.05 දිනට වයස අවුරුදු 18ට නොඅඩු අවුරුදු 35ට නොවැඩි විය යුතුය ;

(ඉ) උස අඩි 04 අඟල් 10ට නොඅඩු විය යුතුය ;

(ඊ) අවිවාහක විය යුතුය ;

(උ) තමන් අයදුම්කරන දිස්ත්‍රික්කය තුළ අවුරුදු 03ක පදිංචිය සනාථ කිරීම සඳහා ඡන්දදායක ලැයිස්තුවේ සහතික කළ පිටපත් අමුණා එවිය යුතු වේ. අයදුම්කරුවන්ගේ නම ඡන්ද නාම ලේඛනයේ සටහන් වී නොමැති නම් ඔහුගේ/ඇයගේ දෙමාපියන්ගේ නම් ඡන්දදායක ලැයිස්තුවේ තිබිය යුතුය. එසේ සඳහන් වන්නේ තම දෙමාපියන්ගේ නම් බව සනාථ කිරීම සඳහා උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක් ද අමුණා එවිය යුතුය :

(ඌ) පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන්ගේ දූ දරුවන් අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමේදී අදාළ වෛද්‍යවරයා පාරම්පරික වෛද්‍යවරයෙකු බවට සනාථ කිරීම සඳහා ආයුර්වේද වෛද්‍ය සභාවේ සහතිකයක් හා ග්‍රාම නිලධාරීගේ සහතිකයක් ඉදිරිපත් කළ යුතු වේ.

3. *අයදුම් කළ යුතු ක්‍රමය :*

(අ) මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව 13" x 8" ප්‍රමාණයේ කඩදාසියක දෙපිටම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත් සකස් කළ යුතු වේ.

(ආ) අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර එය බහාලන කවරයේ වම් කෙළවරේ "*ආයුර්වේද*" සිසු හෙද පුහුණුව සඳහා බඳවා ගැනීම - 2007" යනුවෙන් සඳහන් කොට 2007.11.05 දින හෝ ඊට පෙර "ආයුර්වේද කොමසාරිස්, ආයුර්වේද දෙපාර්තමේන්තුව, නාවින්න, මහරගම" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර තැපෑලෙන් නැති වීම හා ප්‍රමාද වීම පිළිබඳ වග කියනු නොලැබේ.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ/අධ්‍යාපන සේවයේ/රජයේ ගණකාධිකාරී සේවයේ/රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/නීතිඥවරයෙකු හෝ වාර්ෂිකව රු.80,160 නොඅඩු ආරම්භක වැටුපක් සහිත තනතුරක් දරන රජයේ නිලධාරියෙකු විසින් අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන සහතික කළ යුතුය.

4. *තෝරා ගැනීමේ ක්‍රමය හා පුහුණු කිරීමේ පරිපාටිය :*

(අ) අයදුම්කරුවන් අතරින් සුදුස්සන් තෝරා ගැනීම සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් විවෘත ලිඛිත තරග විභාගයක් පවත්වනු ලබන අතර ඉන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. තරග විභාගය සඳහා පහත සඳහන් විෂයය නිර්දේශයට අනුව සකස් කළ පැය 01ක ප්‍රශ්න පත්‍රයකට සියලුම අයදුම්කරුවන් පෙනී සිටිය යුතුය.

*විෂයය නිර්දේශය :* බුද්ධි පරීක්ෂණය
සාමාන්‍ය දැනීම
විෂයානුබද්ධ දැනුම

(ආ) සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අයදුම්කරුවන්ට සම්මුඛ පරීක්ෂණයේ දී ද ලකුණු ලබාදෙන අතර තරග විභාගයේ ලකුණු හා සම්මුඛ පරීක්ෂණයේ ලකුණු අනුව අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයෙන් ලකුණු ලබාදෙන පරිපාටිය පහත සඳහන් පරිදි වේ :

1. වෘත්තීය දැනුම හා පළපුරුද්ද ;
2. පාරම්පරික වෛද්‍යවරයෙකුගේ දරුවන් සඳහා උපරිමය ලකුණු 30ක් ;
3. පෞරුෂත්වය.

තෝරාගත් අයදුම්කරුවන් ආයුර්වේද සිසු හෙද/හෙදියන් වශයෙන් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයට යොමු කරනු ලබන අතර ඔවුන් සිංහල/දෙමළ මාධ්‍යයෙන් අවුරුදු 03ක පුහුණු වීමේ පාඨමාලාවක් හැදෑරිය යුතුය.

(ඇ) පුහුණුව සඳහා ඇතුලත් කර ගන්නා අවස්ථාවේ අභ්‍යාසලාභීන් වෙත දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයෙහි බල පැවැත්වෙන නීති රීති මාලාවක් සපයනු ලැබේ. මෙම නීති රීතිවලට හා කලින් කල පනවනු ලබන වෙනත් නීතිරීතිවලට ද ඔවුන් යටත් වනු ඇත.

(ඈ) පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුළ නියමිත විභාගවලින් අසමත් වන හෝ වැඩ හා හැසිරීම අසතුටුදායක වන හෝ විභාග හා නිවාඩු කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වන අභ්‍යාසලාභීන් ගේ පුහුණුව ඕනෑම අවස්ථාවකදී වන්දි ගෙවීමකින් තොරව නතර කිරීමට හැකිය.

පුහුණු කාලය තුළ දී අභ්‍යාසලාභීන් කිසිම ආකාරයක නිවාඩුවකට හිමිකම් නොලබන අතර පුහුණුව සඳහා නොපැමිණි දින වෙනුවෙන් දීමනාවෙන් සමානුපාතික මුදලක් අඩු කරනු ලැබේ. කෙසේ වෙතත් විභාගයට පෙනී සිටීම සඳහා සෑම වර්ෂයකම 80%ක පැමිණීම අනිවාර්ය වේ.

(ඉ) දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයෙහි පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුළ අභ්‍යාසලාභීන්ට පහත සඳහන් පරිදි දීමනා ගෙවනු ලැබේ :

1. පළමු අවුරුද්ද - මාසිකව රු. 12,920
2. දෙවන අවුරුද්ද - මාසිකව රු. 13,040
3. තෙවන අවුරුද්ද - මාසිකව රු. 13,160

*(ඊ)* පුහුණුව ලබන කාලය තුළ පුහුණුවෙන් ඉවත් වුවහොත් හෝ පුහුණුව හැර ගියහොත් පුහුණු කාලය තුළ ඔහුට හෝ ඇයට ගෙවනු ලබන දීමනා හා රජය විසින් පුහුණුව සඳහා දරන ලද වියදම් සඳහා වැය වූ මුදල ඔහු හෝ ඇය විසින් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු වේ. මේ සඳහා සනාථ කළ හැකි වාර්ෂික ආදායම රු. 3,00,000ක් හෝ ඊට වැඩි ආදායමක් ලබන ඇපකරුවන් දෙදෙනෙකු සමඟ අයදුම්කරු විසින් ගිවිසුමක් අත්සන් කළ යුතු වේ.

5. *විවාහ නොවීමේ කොන්දේසි හා ගිවිසුම්* :

*(අ)* සියලුම අයදුම්කරුවන් ඉල්ලුම් පත්‍රය එවන දිනය වන විට අවිවාහකව සිටිය යුතු අතර, පුහුණුව ලබන තුන් අවුරුදු කාලය තුළ දී අවිවාහකව සිටීම අනිවාර්ය වේ. අවිවාහක බව සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද ග්‍රාම නිලධාරී සහතිකයක් අයදුම්පත සමඟ අමුණා එවිය යුතු වේ.

*(ආ)* සිසු හෙද/හෙදියන් හෙද පුහුණු පාසැල වන දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයට ඇතුළත් වන අවස්ථාවේ දී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, එම පුහුණුව සම්පූර්ණ කිරීමෙන් පසුව සේවයෙන් විශ්‍රාම යන තෙක් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සේවය කරන බවටත් ආයුර්වේද කොමසාරිස් සමඟ ගිවිසුමකට ද එළඹිය යුතුය. ආයුර්වේද කොමසාරිස් විසින් මෙම කාල පරිච්ඡේදය කලින් කලට විනිශ්චය කරනු ඇත.

6. *සේවා නියුක්ත කරවීමේ නියමයන්* :

*(අ)* ඉහත පරිදි පුහුණුවෙන් පසුව පැවැත්වෙන අවසන් විභාගයේ ප්‍රතිඵල මත III ශ්‍රේණියේ හෙද තනතුරට අදාළ වැටුප් පරිමාණය මත තනතුරුවල පුරප්පාඩු ඇති වන පරිදි ආයුර්වේද කොමසාරිස් විසින් පත්වීම් දෙනු ලැබේ.

*(ආ)* මෙම හෙද පුහුණුව සාර්ථකව නිම කිරීම රජයේ ආයුර්වේද රෝහලක හෙද සේවයේ ස්ථිර පත්වීමක් ලබා ගැනීමේ අනිවාර්ය හිමිකමක් නොවනු ඇත.

*(ඇ)* හෙද තනතුරට පත් කිරීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වන අතර එය විශ්‍රාම වැටුප් සහිත තනතුරක් වේ.

7. *සේවා කොන්දේසි හා වැටුප් ක්‍රමය* :

*(අ)* රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 හි එම්ටී-7-2006 පරිදි රු. 15,080-5x150-9x240-7x240-20x320 - 26,420 වැටුප් පරිමාණය මත හෙද නිලධාරී III ශ්‍රේණියේ තනතුරුවලට පවත්නා පුරප්පාඩු සඳහා පත් කරනු ලැබේ.

*(ආ)* හෙද සේවයේ සියලුම නිලධාරීන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, ආයුර්වේද හෙද ව්‍යවස්ථාවේ කොන්දේසිවලට ද, ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට අනුව කරන ස්ථාන මාරු වීම් වලට, මුදල් හා වෙනත් රෙගුලාසිවලට ද, රජය විසින් වරින් වර පනවනු ලබන නීතිරීති හා නියෝගයන්ට ද යටත් වනු ඇත.

අසෝක මාලිමගේ,
ලේකම්,
දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

## සිසු හෙද හෙදියන් පුහුණුව සඳහා බඳවා ගැනීම

01. (අ) මුලකුරු සමඟ අගට යෙදෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :——.

(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්) :——————.

02. තැපැල් ලිපිනය (ඉංග්‍රීසියෙන්) :——————.

03. ස්ථිර ලිපිනය
(සිංහලෙන්) : [ ]

දිස්ත්‍රික්කය :
(ඉංග්‍රීසියෙන්) [ ]

04. උපන් දිනය:- වර්ෂය:————. මාසය:————. දිනය:————.

05. (i) ස්ත්‍රී/පුරුෂ භාවය (ii) විවාහක/අවිවාහක භාවය :-

| | |
|---|---|
| පුරුෂ | |
| ස්ත්‍රී | |

| | |
|---|---|
| විවාහක | |
| අවිවාහක | |

අදාළ කොටුවේ (✓) යොදන්න.

06. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග :

| | |
|---|---|
| ඔව් | |
| නැත | |

අදාල කොටුවේ (✓) යොදන්න.

07. ජාතික හැඳුනුම්පත් අංකය :————.

08. උස:- අඩි :————. අඟල් :————.

09. පුහුණුව හැදෑරීමට අපේක්ෂිත මාධ්‍ය :

| | |
|---|---|
| සිංහල | |
| දෙමළ | |

අදාල කොටුවේ (✓) යොදන්න.

10. (අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය (විද්‍යා විෂය ධාරාව) :
(ලකුණු පිටපත් ද අමුණන්න)

වර්ෂය :————. විභාග අංකය :————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා* | *විෂයය* | *ශ්‍රේණිය* | *කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා* |
|---|---|---|---|---|---|
| 1.<br>2. | | | 3.<br>4. | | |

(ආ) අ.පො.ස. (සා.පෙළ) විභාගය :

*පළමු වාරය* :

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.

(ii) විභාග අංකය :————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා* | *විෂයය* | *ශ්‍රේණිය* | *කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා* |
|---|---|---|---|---|---|
| 1. | | | 7. | | |
| 2. | | | 8. | | |
| 3. | | | 9. | | |
| 4. | | | 10. | | |
| 5 | | | 11. | | |
| 6. | | | 12. | | |

*දෙවන වාරය* :

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.

(ii) විභාග අංකය :————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා* | *විෂයය* | *ශ්‍රේණිය* | *කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා* |
|---|---|---|---|---|---|
| 1. | | | 7. | | |
| 2. | | | 8. | | |
| 3. | | | 9. | | |
| 4. | | | 10. | | |
| 5 | | | 11. | | |
| 6. | | | 12. | | |

11. උසාවියක් ඉදිරියේ ඔබ කිසියම් චෝදනාවකට වැරදිකරු වී ඇත් ද ? :

| | |
|---|---|
| ඔව් | |
| නැත | |

ඔව් නම් විස්තර සපයන්න.

12. *අයදුම්කරුගේ සහතිකය* :

(අ) මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(ආ) මවිසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව මම දැන සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

13. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන.................................. මා පෞද්ගලික ව හඳුනන බවත් ඔහු/ඇය 2007 ................ වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ –

සම්පූර්ණ නම :————,

තනතුර :————,

ලිපිනය :————,

දිනය :————.

10-193

---

## උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය

### උසස් තාක්ෂණ ආයතන සඳහා සිසුන් ඇතුළත් කිරීම - 2008 අධ්‍යයන වර්ෂය

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) මගින් මෙහෙයවන මෙහි පහත දැක්වෙන උසස් ජාතික ඩිප්ලෝමා හා ජාතික ඩිප්ලෝමා පාඨමාලා සඳහා 2006 වර්ෂයේ හෝ ඊට පෙර වර්ෂවල පැරණි හා නව නිර්දේශ යටතේ අ. පො. ස. (උ. පෙළ) සමත් අදාළ සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

*අයදුම්පත්* .– ආදර්ශ අයදුම්පත පහත දක්වා ඇත. එම ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස්කර ගන්නා ලද අයදුම් පත්‍රයක් ඉංග්‍රීසියෙන් සම්පූර්ණ කර රු. 250ක මුදලක් කොළඹ මහජන බැංකු උද්‍යාන විදියේ ශාඛාවෙන් හෝ ශ්‍රී ලංකාවේ වෙනත් ඕනෑම මහජන බැංකු ශාඛාවක් මගින් අංක 0025-100133397613 දරන ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතන ජංගම ගිණුමට බැරකොට ලබාගන්නා ලද කුවිතාන්සිය අයදුම්පතේ අලවා ඔබගේ අයදුම්පත 'අ' කොටසේ සඳහන් පාඨමාලා පැවැත්වෙන උසස් තාක්ෂණ ආයතනයට හෝ උසස් තාක්ෂණ ආයතන අංශයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි ඔබ විසින් අයදුම් කරනු ලබන පාඨමාලාවේ නම සඳහන් කළ යුතුය. එක් ආයතනයකට වඩා අයදුම් කරන්නේ නම් අයදුම් කරනු ලබන සෑම අයදුම් පත්‍රයක් සඳහාම වෙන වෙනම රු. 250 ක වටිනාකමකින් යුත් කුවිතාන්සි සමගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. උක්ත අංක දරන ගිණුමට හැර වෙනත් ගිණුම්වලට බැර කරන ලද කුවිතාන්සි සහිත අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

"අ" කොටසෙහි ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට අයත් උසස් තාක්ෂණ ආයතන/ආයතන අංශවල පවත්වනු ලබන පාඨමාලා හා ලිපිනයන් දක්වා ඇති අතර අයදුම්කරුවන් තම සුදුසුකම් හා සරිලන පාඨමාලා තෝරා ගත යුත්තේ "ආ" කොටසෙහි සඳහන් පාඨමාලා ලැයිස්තුව තුළිනි.

*දේශන පැවැත්වෙන ආකාරය* :

පූර්ණ කාලීන පාඨමාලා සඳහා දේශන සතියේ දිනවල දිවා කාලයේ ද, අර්ධ කාලීන පාඨමාලා සඳහා දේශන සති අන්ත දිවා කාලයේ ද පැවැත්වේ. අර්ධ කාලීන පාඨමාලා අදාල ක්ෂේත්‍රයේ රැකියාවන්හි නියුක්ත අයට පමණක් සීමා කෙරේ.

*පාඨමාලා ගාස්තු.*— දිවා පාඨමාලා සඳහා ගාස්තු අය කරනු නොලැබේ. අර්ධ කාලීන පාඨමාලා සඳහා සෑම සමාසිකයකටම රු. 2,000 බැගින් අයකරනු ලැබේ. (වසරකට සමාසික දෙකකි.) මෙම ගාස්තු වාර්ෂිකව සංශෝධනයකට යටත් වේ.

*සම්මුඛ පරීක්ෂණය.*— සුදුසුකම් අනුව තෝරාගත් අයදුම්කරුවන් අභියෝග්‍යතා පරීක්ෂණයකට හා/හෝ සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. ශිෂ්‍යයන් තෝරා ගැනීම මූලිකව උසස් පෙළ විභාගයේ දී ලබාගත් ඒකාබද්ධ ලකුණු හෝ Z- Score මත පදනම් වේ. සම්මුඛ පරීක්ෂණය සඳහා දිනය, වේලාව, ස්ථානය හා ඉදිරිපත් කළ යුතු ලිපිලේඛන ආදී විස්තර අදාළ ආයතන ප්‍රධානීන් විසින් ලිපියකින් පෞද්ගලිකව දන්වා එවනු ඇත. මුල් සහතික නොමැති අවස්ථාවල දී, ලියාපදිංචියේ දී ඒවා ඉදිරිපත් කිරීමේ එකඟතාවය මත පමණක්, සහතික කළ ඡායා පිටපත් භාරගනු ලැබේ.

*නේවාසික පහසුකම්.*— දෙහිවල හා නයිවල උසස් තාක්ෂණ ආයතනවල සීමිත කාන්තා නේවාසිකාගාර පහසුකම් සහ අම්පාර හාඩි උසස් තාක්ෂණ ආයතනයේ සීමිත කාන්තා/පිරිමි නේවාසිකාගාර පහසුකම් ඇත. මෙම පහසුකම් ලබාදෙනුයේ පූර්ණ කාලීන පාඨමාලා සඳහා ලියාපදිංචි වූ සුදුසුකම් ලත් සිසුන්ගේ ස්ථිර පදිංචියේ දුරස්ථභාවය අනුව පමණි.

### *"අ" කොටස*

උසස් තාක්ෂණ ආයතන/උසස් තාක්ෂණ ආයතන අංශ, ඒවායේ සංකේත අංක, ලිපිනයන් හා දුරකථන අංක

| සංකේත අංකය | ආයතන | ලිපිනයන් | දුරකථන අංක |
|---|---|---|---|
| 01 | උසස් තාක්ෂණ ආයතනය, දෙහිවල. | වෛද්‍ය පාර, දෙහිවල | 011-2738349 |
| 02 | උසස් තාක්ෂණ ආයතනය, ගාල්ල. | කළුවැල්ල, ගාල්ල. | 091-2223774 |
| 03 | උසස් තාක්ෂණ ආයතනය, මහනුවර. | අංක 16, කැප්පෙටිපොල පාර, මහනුවර. | 081-2226644 |
| 04 | උසස් තාක්ෂණ ආයතනය, කුරුණෑගල. | අංක 22/1, විල්ගොඩ පාර, කුරුණෑගල. | 037-2224911 |
| 05 | උසස් තාක්ෂණ ආයතනය, බදුල්ල. | ග්‍රීන්ඩ්ලන්ඩ් ඩ්‍රයිව්, බදුල්ල. | 055-2230218 |
| 06. | උසස් තාක්ෂණ ආයතනය, යාපනය. | අංක 78, පලාලි පාර, යාපනය. | 021-2222595 |
| 07 | උසස් තාක්ෂණ ආයතනය, නයිවල. | නයිවල, එස්සැල්ල, වේයන්ගොඩ. | 033-2292544 |
| 08. | හාඩි උසස් තාක්ෂණ ආයතනය, අම්පාර. | ඉගිනියාගල පාර, අම්පාර. | 063-2222056 |
| 09 | උසස් තාක්ෂණ ආයතනය, ත්‍රිකුණාමලය. | සෙල්වනායගපුරම්, උප්පුවේලි, ත්‍රිකුණාමලය. | 026-2223232 |
| 10. | උසස් තාක්ෂණ ආයතනය, ලබුදූව. | සිරිධම්ම මාවත, ලබුදූව අක්මීමන. | 091-2227880 |
| 11. | උසස් තාක්ෂණ ආයතන අංශය, අනුරාධපුරය. | කාර්මික විදුහල, නව නරගය, අනුරාධපුරය. | 025-2234417 |
| 12* | උසස් තාක්ෂණ ආයතන අංශය, වරකාපොල. | කාර්මික විදුහල, අඹගල පාර වරකාපොල. | 035-2267735 |
| 13 | උසස් තාක්ෂණ ආයතන අංශය, රත්නපුරය. | කාර්මික විදුහල, කොළඹ පාර රත්නපුරය. | 045-5677758 |
| 14 | උසස් තාක්ෂණ ආයතන අංශය, කළුතර. | කාර්මික විදුහල, කලමුල්ල, කළුතර. | 034-5622205 |
| 15 | උසස් තාක්ෂණ ආයතන අංශය, බෙලිඅත්ත. | කාර්මික විදුහල, පුවක්දන්ඩාව, බෙලිඅත්ත. | 047-2243229 |
| 16 | උසස් තාක්ෂණ ආයතන අංශය, සමන්තුරේ. | මහවිදිය, සමන්තුරේ | 067-2261304 |
| 17 | උසස් තාක්ෂණ ආයතන අංශය, මඩකලපුව. | කාර්මික විදුහල, මාන්වන්තුඩුවෙයි, මඩකලපුව. | 065-2247519 |

* වරකාපොල උසස් තාක්ෂණ ආයතන අංශය 2008 වර්ෂයේදී කෑගල්ල උසස් තාක්ෂණ ආයතනයට ගෙන යනු ලැබේ.

*පාඨමාලා හා ඒවා පැවැත්වෙන ආයතන හා ආයතන අංශ*

| පාඨමාලාව | කාලය වසර | පාඨමාලා පැවැත්වෙන ආයතනයන්හි සංකේත අංක |
|---|---|---|
| 1. උසස් ජාතික ගණකාධිකරන ඩිප්ලෝමා (උ.ජා. ග.ඩි) - දිවා/පූර්ණ කාලීන | 4 | 1, 2, 3, 4, 5, 6, 9, 11, 12, 16, 17 |
| 1.1 උසස් ජාතික ගණකාධිකරන ඩිප්ලෝමා - සති අන්ත/අර්ධ කාලීන | 4 | 1, 2, 3, 4, 5, 6, 9, 11, 12, 13, 14, 15, 16, 17 |
| 2. උසස් ජාතික කළමණාකරන ඩිප්ලෝමා - (උ. ජා. ක. ඩි) - දිවා/පූර්ණ කාලීන (ඉංග්‍රීසි මාධ්‍යය) | 3 | 1, 2, 3, 5, 6 |
| 3 උසස් ජාතික තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා (උ. ජා. තො. තා. ඩි) - දිවා/පූර්ණ කාලීන (ඉංග්‍රීසි මාධ්‍යය) | 2 1/2 | 3, 4, 5, 6, 7, 8, 9, 10 |
| 4 උසස් ජාතික තාක්ෂණික ඩිප්ලෝමා - කෘෂිකර්මය (උ.ජා.තා.ඩි.) - දිවා/පූර්ණ කාලීන (ඉංග්‍රීසි මාධ්‍යය) | 3 | 7, 8, 10 |
| 5 උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමා (උ. ජා. ඩි. – ඉංග්‍රීසි) දිවා/පූර්ණ කාලීන | 2 | 1, 2, 3, 4, 5, 6, 8 |
| 5.1 උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමා (උ.ජා.ඩි-ඉංග්‍රීසි) සති අන්ත/ අර්ධ කාලීන | 2 | 1, 2, 3, 4, 5, 6, 8, 9, 11, 12, 14, 15, 16, 17 |
| 6 උසස් ජාතික ව්‍යාපාර අධ්‍යයන ඩිප්ලෝමා (උ. ජා. ව්‍යා. අ. ඩි.)- දිවා/පූර්ණ කාලීන (ඉංග්‍රීසි මාධ්‍යය) | 3 | 1, 2, 3, 5, 6 |
| 7 ව්‍යාපාර මූල්‍ය ජාතික ඩිප්ලෝමා (ව්‍යා. මූ. ජා. ඩි.) - දිවා/පූර්ණ කාලීන (ඉංග්‍රීසි මාධ්‍යය) | 2 | 1 |

*සැලකිය යුතුයි* :-

1 සියලුම පාඨමාලාවලට අදාළ විෂය නිර්දේශ සංශෝධනයට යටත්ව ඇති අතර, 2008 වර්ෂයේ දී ඇතැම් පාඨමාලා සංශෝධිත විෂය නිර්දේශයට අනුව ක්‍රියාත්මක වන අතර, එහිදී පාඨමාලා කාලය වෙනස් විය හැකිය.

2. උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (දිවා/පූර්ණකාලීන) පාඨමාලාව පළමු සහ දෙවන වසර සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් සතියේ දිනවල දිවා කාලයේද, තෙවන, සිව්වන වසර ඉංග්‍රීසි මාධ්‍යයෙන් සති අන්තයේ ද දේශන පවත්වනු ඇත.

3. උසස් ජාතික කළමණාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (පූර්ණ කාලීන) පළමු හා දෙවන වසර සතියේ දිනවල දිවා කාලයේ දී දේශන පවත්වනු ලබන අතර තෙවන වසර සඳහා දේශන පවත්වනු ලබන්නේ සති අන්තයේ දී ය.

4. අ. පො. ස. (උ. පෙ.) නව නිර්දේශය යටතේ අයදුම් කරන්නන් සාමාන්‍ය පොදු පරීක්ෂණය සමත්ව තිබීම අනිවාර්ය වේ.

5. ඒ ඒ පාඨමාලාවන්ට තෝරා ගැනීමේ දී අ. පො. ස. (උ. පෙ.) ඒකාබද්ධ ලකුණු හෝ Z-Socre සැලකිල්ලට ගනු ලැබේ.

6. සුදුසුකම් ලද විභාගයේදී පාඨමාලාවට අදාළ විෂයන්ගෙන්/විෂය ක්ෂේත්‍රයේ සාමාර්ථයක් ලත් අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

7. දිවා/පූර්ණ කාලීන පාඨමාලාව සඳහා වයස අවු. 22 ට අඩු අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

8. ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලයක/අනුබද්ධිත විශ්ව විද්‍යාල ආයතනයක, කාර්මික විද්‍යාලයක, අධ්‍යාපන විද්‍යා පීඨයක/ගුරු පුහුණු ආයතනයක හෝ වෙනත් උසස් තාක්ෂණ ආයතනයක අභ්‍යන්තර ශිෂ්‍යයෙකු වශයෙන් පාඨමාලාවක් හැදෑරීම සඳහා ලියාපදිංචි වී ඇති සිසුන් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ දිවා/පූර්ණ කාලීන පාඨමාලාවන් හැදෑරීම සඳහා බඳවා ගැනීමට සුදුසුකම් නොලබයි. කිසියම් ශිෂ්‍යයකු පාඨමාලාව හදාරන එකම කාලය තුළදී වෙනත් ඉහත දැක්වූ රජයේ ආයතනයක පූර්ණ කාලීන ශිෂ්‍යයෙකු ලෙස පාඨමාලාවන් හදාරන බව හෙලිදරව් වුවහොත් ඔවුන්ගේ ලියාපදිංචිය ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය විසින් අවලංගු කරන බවද සැලකිය යුතුය.

9. කුමන හේතුවක් නිසා හෝ තෝරා ගැනීමෙන් පසු පූර්ණකාලීන සිසුන් අදාළ පාඨමාලාව හැදෑරීම සඳහා වෙනත් උසස් තාක්ෂණ ආයතනයකට හෝ ආයතන අංශයකට මාරු කරනු නොලැබේ.

### "ආ" කොටස

*පාඨමාලාවලට ඇතුලත්වීම සඳහා අවශ්‍ය සුදුසුකම් පහත දැක්වේ*

01. උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (දිවා/පූර්ණ කාලීන) :

පහත සඳහන් සුදුසුකම් අතරින් එකක් :-

(i) අ.පො.ස. (උ. පෙ.) පැරණි නිර්දේශය යටතේ ශුද්ධ ගණිතය හෝ ගණකාධිකරණය විෂයය ඇතුළත්ව විෂයයන් හතරෙන්ම සාමාර්ථය ලබා තිබීම. මින් විෂයයන් දෙකකට එම අවස්ථාවේම හෝ වෙනත් අවස්ථාවකදී හෝ සම්මාන සාමාර්ථ ලබා තිබිය යුතුය.

අ. පො. ස. (උ. පෙ.) විභාගයේ දී ශුද්ධ ගණිතය හෝ ගණකාධිකරණ විෂයයන්ට සම්මාන සාමාර්ථයක් ලබා නැත්නම් අ. පො. ස. (සා. පෙ.) විභාගයේදී ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතුය ;

*හෝ*

(ii) අ. පො. ස. (උ. පෙළ) නව නිර්දේශය යටතේ සංයුක්ත ගණිතය/ ගණකාධිකරණය විෂයය ඇතුලුව විෂයයන් තුනෙන්ම සාමාර්ථය ලබා තිබිය යුතුය. මෙම විෂයයන් තුනෙන් විෂයයන් දෙකකට සම්මාන ලබා තිබිය යුතුය. සංයුක්ත ගණිතය/ගණකාධිකරණය විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා නැත්නම් අ.පො.ස. (සා. පෙ.) විභාගයේ දී ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතුය ;

*හෝ*

(iii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගණක ශිල්පීය ජාතික සහතිකය සමත්වීම

*සහ*

(iv) අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

අ.පො.ස. (උ. පෙළ) පැරණි නිර්දේශය යටතේ විෂයයන් හතරෙන් හෝ නව නිර්දේශය යටතේ විෂයයන් තුනෙන් ලබාගත් ඉහළම ලකුණු තෝරා ගැනීමේ පදනම වේ.

1.1 *උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (අර්ධ කාලීන)* :

පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් :-

(i) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් හෝ අන්තර් මාධ්‍ය පරීක්ෂණය හෝ සමත්වීම ;

(ii) අ. පො. ස. (උ. පෙ.) පැරණි නිර්දේශය යටතේ එක් අවස්ථාවකදී විෂයයන් හතරකින් හෝ නව නිර්දේශය යටතේ එක් අවස්ථාවකදී විෂයයන් තුනකින් සාමාර්ථයක් ලබා තිබීම ;

(iii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගණක ශිල්පීය ජාතික සහතිකය සාමාර්ථයක් ලබා තිබීම ;

(iv) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ව්‍යාපාර අධ්‍යයන ජාතික සහතිකය (ගණකාධිකරණය) සාමාර්ථයක් ලබා තිබීම ;

(v) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගණකාධිකරණය පිළිබඳ ජාතික සහතිකය සාමාර්ථයක් ලබා තිබීම.

*සැ.යු.-* (*අ*) *ප්‍රායෝගික පළපුරුද්ද* - අයදුම්කරු රජයේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ රැකියාවක නිරතව සිටින අයෙකු විය යුතුය :

(*ආ*) පහත සඳහන් සුදුසුකම් දරන්නන් උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාවේ ප්‍රථම වසරින් නිදහස් කර එහි 11 වසරට බඳවා ගැනීම සෙසු අවශ්‍යතාවන් සපුරාලීමේ හා ඉඩකඩ තිබීමේ කොන්දේසියට යටත්ව අනුමත කර ඇත :

(i) ව්‍යාපාර අධ්‍යයන/මූල්‍ය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව ;

(ii) උසස් ජාතික වාණිජ/ කළමණාකරණ ඩිප්ලෝමා හෝ එහි 11 වසර පරීක්ෂණය ;

(iii) විද්‍යාවේදී (ව්‍යාපාර පරිපාලන) උපාධිය ;

(iv) වාණිජවේදී උපාධිය ;

(v) විද්‍යාවේදී (ගණකාධිකරණ) උපාධිය ;

(vi) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ I සහ II පරීක්ෂණය ;

(vii) වරළත් කළමණාකාරීත්ව හා ගණකාධිකරණ ආයතනයේ I සහ II පරීක්ෂණය ;

(viii) ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ III අදියර පරීක්ෂණය.

02. *උසස් ජාතික කළමණාකරන ඩිප්ලෝමා (දිවා/පූර්ණකාලීන) :*

පහත සුදුසුකම් අතුරින් එකක් :-

(i) ඕනෑම විෂය ධාරාවකින් අ. පො. ස. (උ. පෙ.) පැරණි නිර්දේශය යටතේ එක් වරකදී විෂයයන් හතරකින් සමත්වීම හෝ නව නිර්දේශය යටතේ එක්වරක දී විෂයයන් තුනකින් සමත්වීම සහ අ. පො. ස. (සා. පෙ.) විභාගයේ දී ගණිතය හා ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම ; හෝ

(ii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ගණක ශිල්පීන් සඳහා වූ ජාතික සහතික පත්‍රය හෝ රාජ්‍ය පරිපාලනය හෝ අලෙවිකරණය සඳහා වූ ව්‍යාපාර අධ්‍යයන ජාතික සහතිකය සමත්වීම සහ අ. පො. ස. (සා.පෙ.) විභාගයේ දී ගණිතය හා ඉංග්‍රීසි භාෂාවට සාමාර්ථයක් ලබා තිබීම.

03. *උසස් ජාතික තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා (දිවා/පූර්ණකාලීන) :*

පහත සුදුසුකම් අතුරින් එකක් :-

(i) අ.පො.ස. (උ.පෙ.) පැරණි නිර්දේශය යටතේ භෞතික විද්‍යාව/කෘෂි විද්‍යාව ශුද්ධ ගණිතය හා ගණකාධිකරණය යන විෂයයන් අතරින් එකක් සහිතව විෂයයන් හතරකින් එකවර සමත්වී තිබීම ; හෝ

(ii) අ.පො. ස. (උ. පෙ) පැරණි නිර්දේශය යටතේ භෞතික විද්‍යාව/කෘෂි විද්‍යාව, සත්ත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් අතරින් එකක් සහිතව විෂයයන් හතරකින් එකවර සමත්වී තිබීම ; හෝ

(iii) අ.පො. ස. (උ. පෙ.) නව නිර්දේශය යටතේ භෞතික විද්‍යාව/කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය හා ගණකාධිකරණය යන විෂයයන් අතරින් එකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්වී තිබීම; *හෝ*

(iv) අ.පො.ස. (උ. පෙ.) නව නිර්දේශය යටතේ භෞතික විද්‍යාව/කෘෂි විද්‍යාව, ජීව විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් අතරින් එකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්වී තිබීම; සහ

(v) අ.පො.ස (සා. පෙ) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

කෘෂි විද්‍යාව අ.පො. ස. (උ. පෙ.) 1995 සිට ක්‍රියාත්මක වන නව විෂයය නිර්දේශය වේ.

04. උසස් ජාතික තාක්ෂණික ඩිප්ලෝමා (කෘෂිකර්මය) (දිවා/පූර්ණකාලීන) :

(i) අ.පො.ස. (උ.පෙ.) පැරණි නිර්දේශය යටතේ ජීව විද්‍යා අංශයෙන්, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, උද්භිද විද්‍යාව, භෞතික විද්‍යාව හා සත්ත්ව විද්‍යාව යන විෂයයන් අතරින් දෙකක් සහිතව විෂයයන් හතරකින් එකවර සමත්වී තිබීම ; *හෝ*

(ii) එක් වතාවකදී අ.පො.ස. (උ. පෙ.) නව නිර්දේශය යටතේ ජීව විද්‍යා අංශයෙන්, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් දෙකක් සහිතව විෂයයන් තුනකින් සමත්වී තිබීම ; *සහ*

(iii) අ.පො.ස. (සා. පෙ.) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

05. *උසස් ජාතික ඉංග්‍රීසි පිළිබඳ ඩිප්ලෝමා - (පූර්ණ කාලීන/අර්ධ කාලීන) :*

පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් තිබිය යුතුය :

(i) ඉංග්‍රීසි විෂයය ඇතුළුව අ.පො.ස. (උ.පෙ.) විෂයයන් තුනකින් සාමාර්ථය ;

(ii) අ.පො.ස. (උ.පෙ.) විභාගයේ දී විෂයයන් තුනකින් සාමාර්ථය සහ අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී ඉංග්‍රීසි සාහිත්‍යය පිළිබඳ සාමාර්ථයක් සහ ඉංග්‍රීසි භාෂාව විෂයයට සම්මාන සාමාර්ථය (C)

(iii) අ.පො.ස. (උ.පෙ.) විභාගයේ දී විෂයයන් තුනකින් සාමාර්ථය සහ අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයය සඳහා විශිෂ්ඨ සාමාර්ථය (Aහෝ B) ;

(iv) ඉංග්‍රීසි (විශේෂ) ගුරු පුහුණු සහතිකය හෝ විද්‍යා පීඨ ඩිප්ලෝමා සහතිකය (ඉංග්‍රීසි) ;

(v) අ.පො.ස (උ.පෙ.) විභාගයේ දී විෂයයන් තුනකින් සාමාර්ථය සහ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන වාණිජ කර්මාන්ත සහ වැඩිදුර අධ්‍යාපනය සඳහා වන ඉංග්‍රීසි පිළිබඳ ජාතික සහතික පත්‍ර විභාගයෙන් සාමාර්ථය

06. උසස් ජාතික ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමා (දිවා/පූර්ණ කාලීන):

පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් තිබිය යුතුය :

(i) අ.පො.ස. (උ.පෙළ) පැරණි නිර්දේශය යටතේ ආර්ථික විද්‍යාව, වාණිජ හා මූල්‍ය සහ ගණකාධිකරණ යන විෂයයන් තුනෙන් අ.පො.ස. (උ.පෙළ.)සාමාර්ථයක් හෝ ඉහත සඳහන් විෂයයන් දෙකකින් සහ ශුද්ධ ගණිතය, දේශපාලන විද්‍යාව, භූගෝල විද්‍යාව, සිංහල, දෙමළ, ඉංග්‍රීසි, තර්ක ශාස්ත්‍රය හෝ ඉතිහාසය, ව්‍යාපාර සංඛ්‍යානය යන විෂයයන් අතුරෙන් එක් විෂයයක් ද, සාමාර්ථයක් ලබා තිබීම, *හෝ*

(ii) අ.පො.ස. (උ.පෙළ) නව නිර්දේශය යටතේ ආර්ථික විද්‍යාව, ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණය යන විෂයයන් තුනෙන් සාමාර්ථය හෝ ඉහත විෂයයන් දෙකක් සහ භූගෝල විද්‍යාව, ගෘහ ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව, තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය හා ව්‍යාපාර සංඛ්‍යානය යන විෂයයන්ගෙන් එකක් ඇතුළුව විෂයයන් තුනකින් එක්වරකදී සාමාර්ථය ලබාතිබීම ; *හෝ*

(iii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගණක ශිල්පීන් සඳහා වූ ජාතික සහතිකය සාමාර්ථයක් ලබා තිබීම *; සහ*

(iv) අ.පො.ස. (සා. පෙ.) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

07. ව්‍යාපාර හා මූල්‍ය පිළිබඳ ජාතික ඩිප්ලෝමා (දිවා/පූර්ණකාලීන) :

පහත සඳහන් සුදුසුකම් අතරින් එකක් තිබිය යුතුයි :—

(i) අ.පො.ස.(උ.පෙ.) පැරණි නිර්දේශය යටතේ ආර්ථික විද්‍යාව, වාණිජ හා මූල්‍ය, ගණකාධිකරණය ඇතුළු විෂයයන් හතරකින් එක් වරක දී සමත් වී තිබීම ; *හෝ*

(ii) අ.පො.ස. (උ.පෙ.) නව නිර්දේශය යටතේ ආර්ථික විද්‍යාව සහ ව්‍යාපාර අධ්‍යයනය සහ ගිණුම්කරණය යන විෂයයන් තුනෙන් සාමාර්ථය හෝ ඉහත විෂයයන් දෙකක් සහ භූගෝල විද්‍යාව, ගෘහ ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව, තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය, කෘෂි විද්‍යාව හෝ සංයුක්ත ගණිතය යන විෂයයන්ගෙන් එකක් ඇතුළුව එක්වරක දී විෂයයන් තුනකින් සමත්ව තිබීම ; *සහ*

(iii) අ.පො. ස. (සා. පෙ.) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

*සටහන :-*

1. යාපනය, ත්‍රිකුණාමලය, සමන්තුරේ හා මඩකලපුව හා දෙහිවල යන ආයතනයන්හි පාඨමාලා දෙමළ මාධ්‍යයෙන් පැවැත්වේ.

2. උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා සහතිකය1990 ඔක්තෝබර් මස 30 වැනි දින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 46/90 අනුව පිළිගත් විශ්ව විද්‍යාලයක වානිජ විද්‍යාවේදී උපාධිය සාමාන්‍ය සාමාර්ථයට සමානව පිළිගෙන ඇත.

3. දෙහිවල හා මහනුවර උසස් තාක්ෂණ ආයතනවල උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (අර්ධ කාලීන) පාඨමාලාව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.

5. ඔබගේ සුදුසුකම්වලට අනුව ඔබ ප්‍රවේශය සඳහා සලකා බැලීමට කැමති පාඨමාලා ඔබගේ කැමැත්තේ අනුපිළිවෙලින් සඳහන් කරන්න.

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට 2008 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණය අවසාන තීරණය වේ.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2007.10.26 වේ.

එච්. ටී. කමල් පත්මසිරි,
අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය,

අංක : 18/2,
වෝඩ් පෙදෙස,
කොළඹ 07.
*web site : www.sliate.net*

Office use only – COURSE NUMBER .....................

**SPECIMEN APPLICATION FORM**

Sri Lanka Institute of Advanced Technological Education

APPLICATION FORM FOR ADMISSION TO HIGHER NATIONAL DIPLOMA/NATIONAL DIPLOMA COURSE

**Name of the Institute/Institute Section :- ........................**

| | **Name of the Course** | **Order of preference** | **Medium** |
|---|---|---|---|
| **(1)** | ............... | ............... | ............... |
| **(2)** | ............... | ............... | ............... |
| **(3)** | ............... | ............... | ............... |

1. Name with initials :————.
2. Name/Names denoted by Initials :————.
3. address :————.
4. Date of Birth : Year :———. Month :————. Date:———.
   Age (as at 01.01.2008) Years :——. Months :——. Days :——.
5. National Identity Card No.:————.
6. Sex : (Male/Female) :————.
7. Administrative District :———.
8. (i) Result of G.C.E. (A/L) Examination (in or before 2006) :

   Year : ————. Index No. :————. Medium:————.

| | *Pass Subjects* | *Grade* |
|---|---|---|
| 1. | ————. | ————. |
| 2. | ————. | ————. |
| 3. | ————. | ————. |
| 4. | ————. | ————. |

If under new syllabus indicate pass or fail in the general paper...................... . Aggregate/Average Marks or Z-Score of the above examination, issued by the Department of Examination :—

(ii) Result of G.C.E. (O/L) Examination :-

Year : ————. Index No. :————. Medium:————.

| | *Subject* | *Grade* | | *Subject* | *Grade* |
|---|---|---|---|---|---|
| 1 | ————. | ————. | 6 | ————. | ————. |
| 2 | ————. | ————. | 7 | ————. | ————. |
| 3 | ————. | ————. | 8 | ————. | ————. |
| 4 | ————. | ————. | 9 | ————. | ————. |
| 5 | ————. | ————. | 10 | ————. | ————. |

9. Highest Qualification in English as a subject :————.
10. Details of Occupation :————.
    (Only for Part Time/Weekend Courses)
    Date of Appointment :————.
    Post :————.
    E. P. F. Number :————.
    Place of work and Address :————.

I hereby declare that I am not following any other full time course of study in any other state institution. I am aware that my registration will be cancelled at any time during the period of study if it is found that I concurrently follow a full time course at any other state institution. I hereby certify that the information furnished here is true and accurate to the best of my knowledge.

————.
Signature of Applicant.

Date :————.

(The Bank Receipt for Rs.250 payable to SLIATE should be annexed).

10-173

---

## ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
## Sri Lanka Institute of Printing
### ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය
(1984 අංක 18 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද්දකි)

*පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පරිගණක ආශ්‍රිත මුද්‍රණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව*

***Certificate Course in Typesetting and Desk Top Publishing***

ශ්‍රී ලංකාවේ මුද්‍රණ හා ග්‍රැෆික් ක්ෂේත්‍රයන්ට අදාළ පාඨමාලා හඳුන්වාදීමේ අද්විතිය ස්ථානයක් ලබා සිටින රජයේ මුද්‍රණ ආයතනය එම ක්ෂේත්‍රයට අදාළ දැනුම, හැකියා, දක්ෂතා සහ විශේෂඥතා ඥානය ප්‍රවර්ධනය කිරීම සඳහා මුළුමනින්ම කැපවී කටයුතු කරයි.

වර්ෂ 1984 දී පාර්ලිමේන්තු ආඥාපනතක් මගින් ස්ථාපනය කරන ලද මෙම ආයතනය මුද්‍රණ සහ ග්‍රැෆික් ක්ෂේත්‍රයට අදාළ ඉහත සඳහන් පාඨමාලාව ඔක්තෝබර් මාසයේ දී ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මගින් පවත්වනු ලබන මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මෙම පාඨමාලාව මුද්‍රණ හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකස් වන අතර ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තුවන නවකයින් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි. පරිගණක ආධාරයෙන් අකුරු ඇමිණීම පිළිබඳව පුළුල් අවබෝධයක් මින් ලබාදෙන අතර පරිගණක දැනුමක් මුල සිටම පරිගණක භාවිතය සහ මෘදුකාංග අධ්‍යයනය (Computers and Software applications) පිළිබඳව මනා දැනුමක් හා සිත්තම් නිර්මාණය පිළිබඳ මූලික අවබෝධයක් ද ලබා දෙන අතර, මෙම පාඨමාලාව හැදෑරීමට අවශ්‍ය පූර්ණ දැනුම (Certificate Course in Graphic Designing) හා අවබෝධය ලබාදෙයි.

| | | |
|---|---|---|
| පාඨමාලා කාලය | - | පැය 144 (මාස 5) |
| මාධ්‍යය | - | සිංහල/ඉංග්‍රීසි |
| ගාස්තු | - | රු. 8,000 |
| දින | - | සතිපතා සහ සති අන්ත සහ සන්ධ්‍යා පන්ති කීපයක් පැවැත්වේ. |

*පාඨමාලා අන්තර්ගතය (Course Contents)*

* Introduction to Computers
* Keyboard Training and Fonts
* Word Processing using MS Word
* Page Make -up methods using Adobe Pagemaker
* Introduction to Scanning and Image Manipulation
* Introduction to Vector Graphic Applications
* Page Make-up methods using Quark Xpress
* Introduction Internet

මෙම පාඨමාලාවන්ට ඇතුළත්වීමට ඇති ඉඩකඩ සීමාසහිත නිසා සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව තෝරාගනු ලබන අපේක්ෂකයින්ට පමණක් පාඨමාලා හැදෑරීමට අවස්ථාව ලැබේ. පාඨමාලා සාර්ථකව නිම කරන සිසුන්ට රජය පිළිගත් සහතිකයක් පිරිනැමේ.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මෙහෙයවන පරිගණක මුද්‍රණ රටා (සිත්තම්) නිර්මාණය පිළිබඳ පාඨමාලාව

***Certificate Course in Computer Graphic Designing***

ශ්‍රී ලංකාවේ මුද්‍රණ හා ග්‍රැෆික් ක්ෂේත්‍රයන්ට අදාළ පාඨමාලා හඳුන්වාදීමේ අද්විතීය ස්ථානයක් ලබා සිටින රජයේ මුද්‍රණ ආයතනය එම ක්ෂේත්‍රයට අදාළ දැනුම, හැකියා, දක්ෂතා සහ විශේෂඥතා ඥානය ප්‍රවර්ධනය කිරීම සඳහා මුළුමනින්ම කැපවී කටයුතු කරයි.

වර්ෂ 1984 දී පාර්ලිමේන්තු ආඥාපනතක් මගින් ස්ථාපනය කරන ලද මෙම ආයතනය මුද්‍රණ සහ ග්‍රැෆික් ක්ෂේත්‍රයට අදාළ පහත සඳහන් ග්‍රැෆික් ඨමාලාව 2007 නොවැම්බර් මාසයේ දී ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මගින් පවත්වනු ලබන මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මෙම පාඨමාලාව මුද්‍රණ හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකසා ඇත.

පරිගණක ආශ්‍රිත රූ රටා නිර්මාණකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

***Certificate Course in Computer Graphic Designing***

මෙම පාඨමාලාව ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තු වන නවකයින්ට මෙන්ම එම ක්ෂේත්‍රයන්හි නියැලී සිටින සේවක මහතුන් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි. පරිගණක ආධාරයෙන් ග්‍රැෆික්ස් නිර්මාණකරණය පිළිබඳව පුළුල් අවබෝධයක් මින් ලබාදෙන අතර ග්‍රැෆික්ස් නිර්මාණකරණයට අදාල මෘදුකාංග පිළිබඳ පුළුල් න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුමක් ද ලබා දෙයි.

| | | |
|---|---|---|
| පාඨමාලා කාලය | - | පැය 114 (මාස 4) |
| මාධ්‍යය | - | සිංහල/ඉංග්‍රීසි |
| ගාස්තුව | - | රු. 10,500 |
| වේලාවන් | - | සතිපතා සහ සති අන්ත පන්ති කීපයක් පැවැත්වේ. |

*(Course Outline)*

* Introduction to Computers
  (Hard Ware and Soft Ware for Graphic Industry)
* Introduction to Adobe-Indesign for Page Make-up
* Creating and Designing Vector Graphics using Macro Media Free Hand

* Creating and Designing Vector Graphics using Corel Draw
* Creating and Designing Vector Graphics using Adobe Illustrator
* Light and Colour:
  Colour Theory and Colour management, Pantone Traditional CMYK and Hexachrome Colour management Systems.
* How to use Adobe Photoshop as a Raster Graphic Image manipulation application
  Photoshop and Tools
  Image Correction and Image Manipulation
  Colour Corrections and Adjustment
  2D-3D in Photoshop
  Image Modes and blending Modes
  Photoshop inbuilt and Third party plug-in Filters
  Using Layers, Channels and Basic Palettes
  Working with paths and vector shapes
  Masking Systems in Photoshop
* Scanning Technology: How to use Scanner for printing Technology (From Black and White to Colour)
* Out Put Techniques: Colour Seperations and Special Colour out putting
* Visit to Industry Bureaus and Printing Houses to understand the operations of Image Setters and Printing Processors.

මෙම පාඨමාලාවන්ට ඇතුළත්වීමට ඇති ඉඩකඩ සීමාසහිත නිසා සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව තෝරාගනු ලබන අපේක්ෂකයන්ට පමණක් පාඨමාලාව හැදෑරීමට අවස්ථාව ලැබේ. පාඨමාලා සාර්ථකව නිම කරන සිසුන්ට රජය පිළිගත් සහතිකයක් පිරිනැමේ.

*විමසීම්* :

ලේඛකාධිකාරී,
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 08.
දුරකථන අංකය : 2686162/2679791/ෆැක්ස් අංකය : 2686162.
e-mail : sliopreg@sltnet.lk

10-197

---

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

### දහම් පාසැල් අවසාන සහතික පත්‍ර විභාගය - 2007

### ව්‍යවස්ථා සහ නිර්දේශ පත්‍රය

01. යථෝක්ත විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2008 ජනවාරි මාසයේ දී දිවයින පුරා පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පවත්වනු ලැබේ.

02. විභාග මධ්‍යස්ථාන : - උප ලේඛනයේ දක්වා ඇති සෑම දිස්ත්‍රික්කයක් තුළ ම අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව අනුව විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ඇත.

එහෙත් යම් මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන අවස්ථාවල දී එකී විභාග මධ්‍යස්ථානය අවලංගු කොට අදාළ අයදුම්කරුවන් ඊට ආසන්නව පිහිටි විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කිරීමට සිදුවනු ඇත. විභාග මධ්‍යස්ථාන පිහිටුවන දිස්ත්‍රික්ක හා නගර දැක්වෙන ලැයිස්තුව 1 වන උපලේඛනයෙහි දක්වා ඇත.

03. භාෂා මාධ්‍යය: - මෙම විභාගය සිංහල දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන්ම පවත්වනු ලැබේ.

04. සුදුසුකම්: - මෙම විභාගය සඳහා ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවකු ම පහත දක්වා ඇති සුදුසුකම් අතුරෙන් යටත් පිරිසෙයින් කවර හෝ එක් සුදුසුකමක් සපුරා තිබිය යුතුය.

4.1 දහම් පාසලක නව වැනි ශ්‍රේණිය සමත් වී දහම් පාසල් අවසාන සහතික පත්‍ර පන්තියේ යටත් පිරිසෙයින් වර්ෂයක් හෝ ඉගෙනුම් කටයුතුවල නිරත වීම.

4.2 ජාතික පොදු අධ්‍යාපන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් බුද්ධ ධර්මය ඇතුළුව විෂයයන් හයකින් සමත් වී සිටීම හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් බුද්ධ ධර්මය සහිත සමත් වී සිටීම,

හෝ

4.3 කොළඹ තරුණ බෞද්ධ සංගමය මගින් පවත්වන ලද බෞද්ධ ශිෂ්‍ය විභාගයේ ජ්‍යෙෂ්ඨ විභාගයෙන් සමත් වී සිටීම.

*සටහන* - (i) මෙම විභාගය සඳහා ඉදිරිපත් වන සෑම අයදුම්කරුවෙකු ම ඉහත 4 වැනි ඡේදයේ දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති බවට දහම් පාසල් ප්‍රධානාචාර්යවරයෙකු, පරිවේණාධිපතිවරයෙකු හෝ විද්‍යාලයාධිපතිවරයෙකු විසින් සහතික කළ යුතුය.

(ii) විභාගාපේක්ෂකයන්ට මෙම විභාගය සඳහා ඉදිරිපත් විය හැක්කේ දහම් පාසල් අයදුම්කරුවකු වශයෙන් පමණකි.

05. *අයදුම් කිරීම* :-

5.1 දහම් පාසල් අයදුම්කරුවන් - පසුගිය වසරේ සිසුන් ඉදිරිපත් කළ සියලුම දහම් පාසල් වෙත ප්‍රමාණවත් ඉල්ලුම්පත්‍ර සහ උපදෙස් පත්‍රිකා තැපැල් මගින් එවීමට කටයුතු සලසා ඇත. අයදුම්පත් නොලැබුණු හෝ 2006 වසරේ විභාගයට ඉල්ලුම් නොකළ හෝ යම් දහම් පාසලක් වේ නම්, දහම් පාසලේ නම, ලිපිනය, ඉදිරිපත් කරන අයදුම්කරුවන් ගණන යනාදී විස්තර සඳහන් කොට මෙහි 5.6 වන ඡේදයේ සඳහන් ලිපිනයට 2007.10.19 වන දිනට පෙර දැන්විය යුතුය.

5.2 බාහිර අයදුම්කරුවන් - 1999 වසරේ සිට බාහිර අයදුම්කරුවන් ලෙස කිසිදු අපේකෂකයෙකුට මෙම විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. එසේ වුවත්, ඉහත 4 වැනි ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති යම් විභාගාපේක්ෂකයකු වේ නම්, තමන් පදිංචි ස්ථානයට ආසන්න දහම් පාසල මගින් රුපියල් 60 ක විභාග ගාස්තුවක් ගෙවා විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා අවශ්‍ය උපදෙස් සියලුම දහම් පාසල් වෙත ලබා දෙනු ඇත.

5.3 අදාළ දහම් පාසල් ප්‍රධානීන් විසින් ම ඉදිරිපත් කළ යුතු මෙම අයදුම්පත් පිටපත් දෙකකින් යුතුව සකස් කර මුල් පිටපත විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු අතර, අනෙක් පිටපත දහම් පාසල් ප්‍රධානියා වෙත තබා ගත යුතුය. අයදුම්පත්‍ර දෙකෙහිම ප්‍රධානාචාර්යවරයා අත්සන් කර තිබිය යුතුය.

5.4 අයදුම්පත්‍ර භාරගැනීමේ අවසාන දිනය 2007.11.02 වැනි දින වේ.

5.5 අයදුම්පත් පැහැදිලිව ද, නිවැරදිව ද සම්පූර්ණ කළ යුතුය. එසේ නොවන අයදුම්පත් සහ අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.6 දහම් පාසලේ ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු අතර, ලිපිනය වෙනස් වී නම් එය දැන්විය යුතුය. දුරකථන පහසුකම් ඇත්නම් එම අංකය ද සඳහන් කරන්න. සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට ඉදිරිපත් කළ යුතුය අයදුම්පත් ලැබුන බව දන්වා එවනු නොලැබේ :

විභාග කොමසාරිස් ජනරාල්,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
පැලවත්ත, බත්තරමුල්ල.

5.7 අයදුම්පත් බහා එවන කවරයේ වමත්පස ඉහළ කෙළවරේ "දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2007" යනුවෙන් ද ඉල්ලුම් කරන නගරය ද සඳහන් කළ යුතුය.

5.8 කිසිම සහතිකයක් අයදුම්පත් සමග අමුණා එවීම අවශ්‍ය නොවේ.

5.9 අයදුම්කරුවන්ගේ අදාළ සහතික පිළිබඳවත් සුදුසුකම් ලබා තිබීම පිළිබඳවත් අයදුම්පත් සහතික කරන පරිවේණාධිපතිවරයා, ප්‍රධානාචාර්යවරයා හෝ විද්‍යාලයාධිපතිවරයා වගකිව යුතුය.

6. *විභාග ගාස්තු* .- මෙම විභාගය සඳහා නියමිත විභාග ගාස්තුව රු. 60 කි. එහෙත් ප්‍රථම වතාවට ඉදිරිපත් වන අයදුම්කරුවන් මෙම විභාග ගාස්තුවෙන් නිදහස් කරනු ලැබේ.

6.1 *විභාග ගාස්තු ගෙවීම* .- පරිවේණාධිපති ස්වාමීන් වහන්සේ විසින් සියළුම අයදුම්කරුවන්ගේ විභාග ගාස්තු එකතු කොට, දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකට එම මුදල ගෙවා, එක් ලදු පතක් ලබාගෙන, එම ලදු පත අයදුම්පත්‍රයේ පසු පිටේ නොගැලවෙන සේ අලවා එවිය යුතුය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. (මුද්දර හා මුදල් ඇණවුම් භාරගනු නොලැබේ).

6.2 විභාග ගාස්තු ආපසු ගෙවීම.- කුමන කරුණක් නිසාවත් මෙම විභාගය සඳහා ගෙවන ගාස්තුව වෙනත් විභාගයකට මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් හෝ සිදු කරනු නොලැබේ.

7. *ප්‍රවේශ පත්‍ර* .- විභාගයට ඇතුළත් කර ගන්නා සෑම අයදුම්කරුවෙකු වෙතම විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍රයක්, ඉල්ලුම්පත් ඉදිරිපත් කළ දහම් පාසල් ප්‍රධානාචාර්ය මගින් නිකුත් කරනු ඇත.

7.1 විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙකු විසින් ම ස්වකීය ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවාගෙන, විභාගයට පෙනී සිටින ප්‍රථම අවස්ථාවේදීම විභාග ශාලාධිපති වෙත භාරදිය යුතුය. යම් අයදුම්කරුවකු තම ප්‍රවේශ පත්‍රය භාර නොදී සිටී නම් හා විභාග කොමසාරිස් ජනරාල් විසින් තමාට නියම කරන විභාග මධ්‍යස්ථානය හැර වෙනත් විභාග මධ්‍යස්ථානයකදී විභාගයට පෙනී සිටී නම්, ඔහුගේ විභාග අපේක්ෂකත්වය අහෝසි වනු ඇත.

7.2 ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන, දහම් පාසල් ප්‍රධානාචාර්යවරයෙකු හෝ පරිවේණාධිපතිවරයෙකු හෝ රජයේ විද්‍යාලයාධිපතිවරයෙකු හෝ වර්ෂයකට රුපියල් 2,30,700 කට වැඩි ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර සේවයෙහි නියුතු නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

7.3 විභාගය පැවැත්වීමට දින 07කට පෙර ප්‍රවේශපත්‍රයක් නොලැබුණහොත්, එකී දහම් පාසැල් ප්‍රධානියා විසින් ඒ බව නොපමාව විභාග කොමසාරිස් ජනරාල් වෙත දැන්විය යුතුය. එවැනි සෑම අවස්ථාවකදීම පහත සඳහන් විස්තර සැපයිය යුතුය :

1. විභාගයේ නම ;
2. දහම් පාසලේ නම :
3. සම්පූර්ණ නම හා ලිපිනය :
4. ඉල්ලුම් කළ විභාග මධ්‍යස්ථානය/නගරය :
5. ඉල්ලුම්පත්‍රය තැපැල් කළ තැපැල් කාර්යාලය :
6. ලියාපදිංචි කළ අංකය හා දිනය :
7. විභාග ගාස්තු ගෙවා ඇත්නම් එම ලදුපතේ අංකය, දිනය හා තැපැල් කාර්යාලය

8. *හැඳුනුම්පත* .- එක් එක් විෂයයට පෙනී සිටින සෑම අවස්ථාවේදී ම විභාග ශාලාධිපතිට පිළිගත හැකි වන පරිදි අපේක්ෂකයන් විසින් තමන්ගේ අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා සූදානම්ව පැමිණිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් පිළිගනු ලැබේ :

8.1 පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම් පත,

8.2 වලංගු විදෙස් ගමන් බලපත්‍රය,

8.3 සංස්කෘතික දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන භික්ෂු හැඳුනුම් පත.

9. *සමත් බව තීරණය කිරීම හා ප්‍රතිඵල නිකුත් කිරීම* .- මෙම විභාගය සඳහා නියමිත විෂයන් ගණන හතරක් වන අතර, විභාගයෙන් සාමාර්ථය ලැබීම සඳහා සෑම විභාග අපේක්ෂකයෙකු ම එම විෂයයන් හතරෙන් ම සමත් විය යුතුය. කෙසේ වෙතත් එක් වතාවකදී අදාළ විෂය හතරෙන් එක් විෂයයක් පමණක් අසමත් නම් එය ඌන සාමාර්ථයක් ලෙස සලකනු ලැබේ. විභාගයේ ප්‍රතිඵල නිකුත් කළ දින සිට අනුගාමී වසර තුනක් (03) ඇතුළත එම ඌන සාමාර්ථය ලැබූ විෂයය සඳහා නැවත පෙනී සිට එය සමත් වී ඌන සාමාර්ථය සම්පූර්ණ කළ හැකිය. (මෙය 2007 වසරේ විභාගයේ සිට බල පැවැත්වේ).

9.1 අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ලැයිස්තු අදාල දහම් පාසල් ප්‍රධානීන් වෙත තැපැල් මගින් එවනු ලැබේ.

10. *සහතික පත්‍ර* .- මෙම විභාගයෙන් සමත් වන සෑම අයදුම්කරුවෙකුටම සහතික පත්‍රයක් නිකුත් කිරීමට විධිවිධාන යොදනු ලැබේ.

11. *උත්තර පත්‍ර නැවත සමීක්ෂණය* .- දහම් පාසල් ප්‍රධානාචාර්යවරුන්ගේ ඉල්ලීම් මත පමණක් උත්තර පත්‍ර නැවත සමීක්ෂණයට ඉඩ දෙනු ලැබේ. විභාගයේ ප්‍රතිඵල නිකුත් වී දින 30 ක් ඇතුළත මෙම දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන ආකෘති පත්‍රයකින් උත්තර පත්‍ර නැවත සමීක්ෂණය සඳහා ඉල්ලුම් කළ යුතුය. මේ සඳහා වන ගාස්තු ප්‍රමාණයන් වරින් වර සංශෝධනය වීමට ඉඩ ඇති බැවින්, එය අදාළ අයදුම්පතෙහි දක්වනු ලැබේ. මෙම ගාස්තු ආපසු ගෙවනු ලබන්නේ මුලින්ම දෙන ලද ප්‍රතිඵලයක වෙනසක් කිරීමට සිදුවුවහොත් පමණකි. කවර හේතුවක් නිසාවත් අයදුම්කරුවන්ට හෝ ඔහුගේ නියෝජිතයන්ට උත්තර පත්‍ර පරීක්ෂා කර බැලීමට ඉඩ දෙනු නොලැබේ.

12. මෙම ව්‍යවස්ථා සහ විෂය නිර්දේශ සංග්‍රහයේ දක්වා ඇති විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමට සියලුම ම විභාග අයදුම්කරුවන් බැඳී සිටින අතර, මෙහි විධිවිධාන සලසා නැති කවර හෝ යම් කරුණක් වෙතොත් එය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි තීරණය වනු ඇත.

අනුර එදිරිසිංහ,
විභාග කොමසාරිස් ජනරාල්.

2007 සැප්තැම්බර් මස 21 වැනි දින,
පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

විභාග විෂයයය හා විෂය නිර්දේශය
(1993 සිට ඉදිරියට පැවැත්වෙන විභාග සඳහා)

මෙම විභාගය පැය 03 බැගින් වූ ප්‍රශ්න පත්‍ර 4කින් සමන්විතය.)

*1 වැනි ප්‍රශ්න පත්‍රය*

බුද්ධ චරිතය

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් යුක්තයි.

*1 වැනි කොටස*

බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි පැවති භාරතීය සමාජය අවබෝධ කර ගැනීම -

(අ) සාමාජික පසුබිම
(ආ) දේශපාලනික පසුබිම
(ඇ) ආර්ථික පසුබිම
(ඈ) ආගමික හා දාර්ශනික පසුබිම

II කොටස - බුද්ධ චරිතය

(අ) සිද්ධාර්ථ කුමාරෝත්පත්තියේ සිට සම්බුද්ධ පරිනිර්වාණය තෙක් බුද්ධ චරිතය.
(ආ) බුද්ධ චරිතයේ කැපී පෙනෙන විශිෂ්ට ලක්ෂණ - තාදි ගුණය, අසරණයන්ට පිහිට වීම, ගිලනුන්ට උපස්ථාන කිරීම, හික්මවිය යුතු පුද්ගලයන් හික්මවීම, ඉවසීම, අන්‍යාය මත ඉවසීම,
(ඇ) බුදුරජාණන් වහන්සේගේ ලොව්තුරු ගුණ
(ඈ) බුදුරජාණන් වහන්සේගේ සමාජ ශෝධකත්වය
(ඉ) බුදුරජාණන් වහන්සේගේ නායකත්වය

III කොටස - බුදුරජාණන් වහන්සේගේ සිව්වණක් පිරිස

(අ) භික්ෂු - පස්වග භික්ෂූන්, සැරියුත්, මුගලන්, මහා කාශ්‍යප, ආනන්ද, සීවලී, මහා කච්චාන, පුණ්ණමන්තානි පුත්ත, කුමාර කාශ්‍යප යන රහතන් වහන්සේ පිළිබඳ දැනුම
(ආ) භික්ෂුණී- මහාප්‍රජාපතී ගෝතමී, ඛේමා, උප්පලවණ්ණා, භද්දකච්චානා, ධම්මදින්නා, අම්බපාලි, පටාචාරා යන තෙරණීන් වහන්සේ පිළිබඳ දැනුම.
(ඇ) උපාසක - සේනිය, බිම්බිසාර, පසේ නදී කෝසල, අජාසත්, අනාථ පිණ්ඩික, ධම්මික යන උපාසකවරුන් පිළිබඳ දැනුම.
(ඈ) උපාසිකා - විශාඛා, කෝසල මල්ලිකා, සාමාවතී, ඛුජ්ජුත්තරා යන උපාසිකාවන් පිළිබඳ දැනුම.

2 වැනි ප්‍රශ්න පත්‍රය

බුද්ධ ධර්මය හා පාලි භාෂා පරිචය

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විතය

I කොටස - බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම

(අ) පටිච්ච සමුප්පාදය
(ආ) චතුරාර්ය සත්‍යය
(ඇ) ත්‍රිලක්ෂණය
(ඈ) කර්මය සහ පුනර්භවය
(ඉ) නිර්වාණය

මෙම ධර්ම කරුණු පිළිබඳව ථෙරවාදී බෞද්ධ සම්ප්‍රදායයෙහි අර්ථ විවරණය පිළිබඳ සාමාන්‍ය අවබෝධය.

*II කොටස - භාවනා සහ අභිධර්මය*

(අ) සමථ විපස්සනා භාවනා
(ආ) අභිධර්මයෙහි සතර පරමාර්ථ ධර්ම පිළිබඳ සාමාන්‍ය දැනුම

III *කොටස - පාලි භාෂා පරිචය*

පහත සඳහන් ගාථා සහ පාඨ සිංහලට පරිවර්තන කිරීම :

(අ) ධම්මපදය- යමක වග්ග 19, 20 ගාථා, පුප්ඵ වග්ග, 03 ගාථාව, බාල වග්ග - 05, 06, 10, 14, 15 ගාථා පණ්ඩිත වග්ග 12, 13, 14 ගාථා

(ආ) චතු භාණවාර පාලි -
(i) මිත්තානිසංස සුත්ත
(ii) මෙත්තානිසංස සුත්ත
(iii) ඛන්ධ පරිත්ත

(ඇ) රසවාහිණී - දුට්ඨ ගාමිණී අභය මහාරඤ්ඤවත්ථු

(ඈ) වන්දනා ගාථා සහ පාඨ
(i) තෙරුවන් ගුණ පාඨ සහ වන්දනා ගාථා
(ii) ආමිස පූජා ගාථා

3 වැනි ප්‍රශ්න පත්‍රය

ශාසන ඉතිහාසය

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්තයි

(i) භාරතීය ශාසන ඉතිහාසය
(ii) ශ්‍රී ලංකා ශාසන ඉතිහාසය

I *කොටස - භාරතීය ශාසන ඉතිහාසය*

(අ) බෞද්ධ ධර්මදූත සේවාවේ ආරම්භය සහ බුද්ධ කාලීන ශාසන ව්‍යාප්තිය
(ආ) ධර්ම සංගායනා සතර
(ඇ) අශෝක සමය
(ඈ) අශෝක රජතුමා බෞද්ධයෙකු වීම
(ඉ) අශෝක ධර්මය
(ඊ) අශෝක රජුගේ ලෝක ශාසනික සේවාව
(උ) බෞද්ධ ඉතිහාසයේ අශෝක රජතුමාට හිමි තැන අගය කිරීම

2 කොටස - ශ්‍රී ලංකා ශාසන ඉතිහාසය

(අ) මහින්දාගමනය සහ බුද්ධ ශාසන ප්‍රතිෂ්ඨාපනය
(ආ) භික්ෂුනී සමාජය
(ඇ) ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩම කරවීම
(ඈ) දන්ත ධාතූන් වහන්සේ වැඩම කරවීම
(ඉ) මහා විහාරය
(ඊ) අභයගිරි විහාරය
(උ) ජේතවන විහාරය
(ඌ) ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම
(එ) බුදු සමයෙන් ලක් වැසියන් ලද ආභාෂය

4 වැනි ප්‍රශ්න පත්‍රය

බෞද්ධ සංස්කෘතිය

මෙම ප්‍රශ්න පත්‍රය බෞද්ධ සිරිත් විරිත්, ශ්‍රී ලංකාවේ කලා ශිල්ප හා ලෝක බෞද්ධ සංස්කෘතිය යන කොටස් තුනකින් යුක්ත වෙයි.

### *I කොටස - බෞද්ධ සිරිත් විරිත්*

(අ) බෞද්ධ සිරිත් විරිත්වල වැදගත්කම
(ආ) බෞද්ධ ආරාම (පැවිදි) ජීවිතය ආශ්‍රිත සිරිත් විරිත්
(ඇ) ආරාම ජීවිතය පදනම් වූ බෞද්ධ ගිහි සිරිත් විරිත්
(ඈ) ගිහි පවුල් ජීවිතය සම්බන්ධ සිරිත් විරිත්
(ඉ) ශාසනික කටයුතු පිළිබඳ සිරිත් විරිත්

(සාංඝික දාන, කඨින දාන, ධර්ම දේශනා හා ධර්ම ශ්‍රවණ, පිරිත් පින්කම් හා බෝධි පූජා) බෞද්ධ උත්සව

### *II කොටස - ශ්‍රී ලංකාවේ බෞද්ධ කලා ශිල්ප*

බුදු දහමෙන් සිදු වූ කලා පෝෂණය
බෞද්ධ ගෘහ නිර්මාණ ශිල්පය (ස්ථූප, චෛතියඝර, බෝධිඝර, පධාංඝර)

බෞද්ධ මූර්ති, කැටයම් හා චිත්‍ර කලාව

(i) බුදු පිළිමය - උපත හා ව්‍යාප්තිය, අනුරාධපුර සමාධි පිළිම, තොලුවිල සමාධි පිළිමය, අවුකන බුදු පිළිමය, ගල් විහාරේ බුදු පිළිම

(ii) කැටයම් - වාහල්කඩ. සඳකඩ පහණ, මුරගල්, කොරවක්ගල් හා පියගැට

(iii) බෞද්ධ චිත්‍ර කලාව - අනුරාධපුර, පොළොන්නරුව හා මහනුවර යුගයේ බිතුසිතුවම් (මහියංගන ධාතු ගර්භය, තිවංක පිළිමගේ, දෙගල්දොරුව, කැළණියේ අළුත් විහාරය, ගෝතමී විහාරය යන ස්ථානවල බිතු සිතුවම්)

### *III කොටස - සිංහල බෞද්ධ සාහිත්‍යය*

බෞද්ධ කථා සාහිත්‍යයේ ආචාර, විද්‍යාත්මක වටිනාකම, ජාතක පොත, සද්ධර්ම රත්නාවලිය හා පූජාවලිය පිළිබඳ සාමාන්‍ය දැනීම.

සිංහල භක්ති කාව්‍යය - බුදුගුණ අලංකාරය හා තුන් සරණය පිළිබඳ සාමාන්‍ය දැනුම

### *IV කොටස - ලෝක බෞද්ධ සංස්කෘතිය*

පහත සඳහන් රටවලට බුදු දහම පැමිණීම, ව්‍යාප්තිය හා බෞද්ධ සංස්කෘතික ලක්ෂණ පිළිබඳ සාමාන්‍ය දැනුම

(අ) මියන්මාර් (බුරුමය)
(ආ) තායිලන්තය
(ඇ) චීනය
(ඈ) ජපානය

පරිශීලනය කළ යුතු ග්‍රන්ථ
බෞද්ධ සංස්කෘතිය - සිරි සීවලී හිමි
කලා ශිල්ප හා සාහිත්‍ය - ඩී. ආර්. ජයවර්ධන
අතිරේක කියවීම් පොත් -
බුදු සිරිත - කේ. ඩී. පී. වික්‍රමසිංහ

### *I වැනි උපලේඛනය*

ඒ ඒ දිස්ත්‍රික්කයන්හි විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර හා නගර අංක:

| දිස්ත්‍රික්කය කොළඹ 01 | |
|---|---|
| නගරය | නගර අංකය |
| කොටහේන | 101 |
| මරදාන | 102 |
| බොරැල්ල | 103 |
| ගල්කිස්ස | 104 |
| බම්බලපිටිය | 105 |
| දෙහිවල | 106 |
| නුගේගොඩ | 107 |
| මොරටුව | 108 |
| පිළියන්දල | 109 |
| හෝමාගම | 110 |
| මහරගම | 111 |
| අවිස්සාවේල්ල | 112 |

| දිස්ත්‍රික්කය - ගම්පහ 02 | |
|---|---|
| නගරය | නගර අංකය |
| ගම්පහ | 213 |
| මිනුවන්ගොඩ | 214 |
| මීරිගම | 215 |
| වේයන්ගොඩ | 216 |
| මීගමුව | 217 |
| වත්තල | 218 |
| කැළණිය | 219 |

| දිස්ත්‍රික්කය - කළුතර 03 | |
|---|---|
| නගරය | නගර අංකය |
| කළුතර | 320 |
| පානදුර | 321 |
| හොරණ | 322 |
| මතුගම | 323 |
| අළුත්ගම | 324 |
| මීගහතැන්න | 325 |

| දිස්ත්‍රික්කය - මාතලේ 04 | |
|---|---|
| නගරය | නගර අංකය |
| මාතලේ | 426 |
| ගලේවෙල | 427 |
| නාඋල | 428 |
| ලග්ගල-පල්ලේගම | 429 |
| දඹුල්ල | 430 |

| දිස්ත්‍රික්කය - මහනුවර 05 | |
|---|---|
| නගරය | නගර අංකය |
| මහනුවර | 531 |
| කටුගස්තොට | 532 |
| තෙල්දෙනිය | 533 |
| වත්තේගම | 534 |
| ගලහ | 535 |
| නුගවෙල | 536 |
| ගලගෙදර | 537 |
| ගම්පොල | 538 |
| පිළිමතලාව | 539 |
| මැද මහනුවර | 540 |
| නාවලපිටිය | 541 |

| දිස්ත්‍රික්කය - නුවරඑළිය 06 | |
|---|---|
| නගරය | නගර අංකය |
| නුවරඑළිය | 642 |
| හැඳුනුවැව | 643 |
| හැටන් | 644 |
| ගිනිගත්හේන | 645 |
| හගුරන්කෙත | 646 |
| වලපනේ | 647 |

| දිස්ත්‍රික්කය - ගාල්ල 07 | |
|---|---|
| නගරය | නගර අංකය |
| ගාල්ල | 748 |
| අම්බලන්ගොඩ | 749 |
| ඇල්පිටිය | 750 |
| උඩුගම | 751 |
| අහංගම | 752 |
| බද්දේගම | 753 |
| බලපිටිය | 754 |

| දිස්ත්‍රික්කය- මාතර 08 | |
|---|---|
| නගරය | නගර අංකය |
| මාතර | 855 |
| වැලිගම | 856 |
| කඹුරුපිටිය | 857 |
| හක්මන | 858 |
| දික්වැල්ල | 859 |
| අකුරැස්ස | 860 |
| දෙනියාය | 861 |

| දිස්ත්‍රික්කය - හම්බන්තොට 09 | |
|---|---|
| නගරය | නගර අංකය |
| හම්බන්තොට | 962 |
| වලස්මුල්ල | 963 |
| වීරකැටිය | 964 |
| තංගල්ල | 965 |
| අම්බලන්තොට | 966 |
| බෙලිඅත්ත | 967 |
| තිස්සමහාරාමය | 968 |
| අගුණකොලපැලැස්ස | 969 |

| දිස්ත්‍රික්කය - වව්නියාව 10 | |
|---|---|
| නගරය | නගර අංකය |
| වව්නියාව | 1070 |

| දිස්ත්‍රික්කය- ත්‍රිකුණාමලය 11 | |
|---|---|
| නගරය | නගර අංකය |
| ත්‍රිකුණාමලය | 1171 |
| කන්තලේ | 1172 |

| දිස්ත්‍රික්කය - අම්පාර 12 | |
|---|---|
| නගරය | නගර අංකය |
| අම්පාර | 1273 |
| සේරංකඩ | 1274 |
| මහඔය | 1275 |
| දෙහිඅත්තකණ්ඩිය | 1276 |

| දිස්ත්‍රික්කය - පුත්තලම 13 | |
|---|---|
| නගරය | නගර අංකය |
| පුත්තලම | 1377 |
| ආණමඩුව | 1378 |
| හලාවත | 1379 |
| වෙන්නප්පුව | 1380 |

| දිස්ත්‍රික්කය - කුරුණෑගල 14 | |
|---|---|
| නගරය | නගර අංකය |
| කුරුණෑගල | 1481 |
| පොල්ගහවෙල | 1482 |
| කුලියාපිටිය | 1483 |
| ඉබ්බාගමුව | 1484 |
| මැල්සිරිපුර | 1485 |
| හෙට්ටිපොල | 1486 |
| නිකවැරටිය | 1487 |
| මහව | 1488 |
| ගල්ගමුව | 1489 |

| දිස්ත්‍රික්කය - අනුරාධපුර 15 | |
|---|---|
| නගරය | නගර අංකය |
| අනුරාධපුරය | 1590 |
| මැදවච්චිය | 1591 |
| කැකිරාව | 1592 |
| පදවිය | 1593 |
| ගලෙන්බිඳුනුවැව | 1594 |
| තඹුත්තේගම | 1595 |
| හොරොව්පතාන | 1596 |
| නොච්චියාගම | 1597 |

| දිස්ත්‍රික්කය - පොළොන්නරුව 16 | |
|---|---|
| නගරය | නගර අංකය |
| පොළොන්නරුව | 1698 |
| මනන්පිටිය | 1699 |
| හිඟුරක්ගොඩ | 1600 |
| මැදිරිගිරිය | 1601 |

| දිස්ත්‍රික්කය - බදුල්ල 17 | |
|---|---|
| නගරය | නගර අංකය |
| බදුල්ල | 1702 |
| වැලිමඩ | 1703 |
| බණ්ඩාරවෙල | 1704 |
| පස්සර | 1705 |
| මහියංගනය | 1706 |
| ගිරාඳුරුකෝට්ටේ | 1707 |
| මීගහකිවුල | 1708 |

| දිස්ත්‍රික්කය - මොණරාගල 18 | |
|---|---|
| නගර | නගර අංකය |
| මොණරාගල | 1809 |
| බිබිල | 1810 |
| වැල්ලවාය | 1811 |
| කතරගම | 1812 |
| දොඹගහවෙල | 1813 |

| දිස්ත්‍රික්කය - කෑගල්ල 19 | |
|---|---|
| නගරය | නගර අංකය |
| කෑගල්ල | 1914 |
| අරණායක | 1915 |
| රඹුක්කන | 1916 |

| දිස්ත්‍රික්කය - කෑගල්ල 19 | |
|---|---|
| නගරය | නගර අංකය |
| මාවනැල්ල | 1917 |
| රුවන්වැල්ල | 1918 |
| යටියන්තොට | 1919 |
| වරකාපොල | 1920 |

| දිස්ත්‍රික්කය - රත්නපුර 20 | |
|---|---|
| නගරය | නගර අංකය |
| රත්නපුර | 2021 |
| ඇහැලියගොඩ | 2022 |
| පැල්මඩුල්ල | 2023 |
| බලංගොඩ | 2024 |
| ඇඹිලිපිටිය | 2025 |
| රක්වාන | 2026 |
| කලවාන | 2027 |

10-213

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

සංශෝධිත ගාස්තු

1995 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළකරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. කාර්යාල වේලාවන් පෙරවරු 9.00 සිට පස්වරු 4.45 දක්වා වේ.

4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.30 සිට පස්වරු 3.30 දක්වා බව සැලකිය යුතුයි.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති තැනට එවිය යුතුය.

6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහ පළ කරන්නට නියමිත 'පිටපත' කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ටයිප් ගසා එවිය යුතුයි. අත් අකුරින් යුතු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතෙකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1995 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේයි ÷

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | 51 | 0 |
| වැඩිවන සෑම අඟලකටම හෝ ඉන් කොටසකටම | 51 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | 504 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | 1,008 | 0 |

(අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)

11. සෑම සිකුරාදා දිනයකම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයක් පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. සෑම මාසයකම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1995.01.01 දින සිට සංශෝධිත දායක ගාස්තුව* :-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික)

| | මෙරට | | පිටරට | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| I වන කොටස සම්පූර්ණයෙන් (I, II, III ඡේද තුනම ඇතුළත්) | 1,612 | 0 | 2,098 | 0 |
| II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 572 | 0 | 745 | 0 |
| I වන ඡේදය | 520 | 0 | 1,007 | 0 |
| II වන ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර්, විභාග ආදිය) | 624 | 0 | 1,009 | 0 |
| III වන ඡේදය | 468 | 0 | 907 | 0 |
| අති විශේෂ ගැසට් පත්‍රය | 3,360 | 0 | 4,422 | 0 |

ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ 12 මාසයකට නොඅඩු කාලසීමාවකට පමණය.

*තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | | මිළ ගාස්තුව | | තැපැල් (මෙරට) | |
|---|---|---|---|---|---|
| | | රු. | ශ. | රු. | ශ. |
| (අ) | I වන කොටස | 31 | 0 | 5 | 0 |
| | II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 11 | 0 | 5 | 0 |
| (ආ) | I වන ඡේදය | 10 | 0 | 5 | 0 |
| | II වන ඡේදය | 12 | 0 | 5 | 0 |
| | III වන ඡේදය | 9 | 0 | 5 | 0 |

* දායක මුදල් භාරගැනීම සහ තනිපිටපත් විකිණීම භාර රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියළු දෙනාගේම පහසුවටද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් අංක 132, මායා මාවත, කිරුළපන, කොළඹ 05. රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

*සැළකිය යුතුයි.-* මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2007** | | | |
| ඔක්තෝබර් | 2007.10.05 | සිකුරාදා | 2007.09.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.10.12 | සිකුරාදා | 2007.09.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.10.19 | සිකුරාදා | 2007.10.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.10.26 | සිකුරාදා | 2007.10.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| නොවැම්බර් | 2007.11.02 | සිකුරාදා | 2007.10.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.11.09 | සිකුරාදා | 2007.10.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.11.16 | සිකුරාදා | 2007.11.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.11.23 | සිකුරාදා | 2007.11.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.11.30 | සිකුරාදා | 2007.11.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| දෙසැම්බර් | 2007.12.07 | සිකුරාදා | 2007.11.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.12.14 | සිකුරාදා | 2007.11.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.12.20 | බ්‍රහස්පතින්දා | 2007.12.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.12.28 | සිකුරාදා | 2007.12.14 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.